**ශීර්ෂය - 19 පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලය**
**-----------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 තත්වාගණනය කළ මතය**
**----------------------------**

පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 09 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම**
**------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
**------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- කාර්යාලයට අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ). මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ). ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවේ 1.6.1(ආ)(ii), 1.6.1(ආ)(iii), 1.6.1 (ඉ)( ii ), 1.6.1 (ඉ)( iii ) ඡේද යටතේ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ). 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ලෙස හඳුනා ගෙන තිබුණු භාණ්ඩ වර්ග 17 ක ඒකක 41 ක ස්ථාවර වත්කම්, සමාලෝචිත වර්ෂය තුළ විනාශ කිරීම මගින් අපහරණය කර තිබුණු නමුත්, එම වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ-6 ආකෘතිය යටතේ වූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අපහරණයන් යටතේ වාර්තා කිරීම හෝ මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂය තුළ අපහරණයන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වීම. | මෙම වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණු බැවින් සහ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දැක්වීමට නොහැකි බැවින් එලෙස සටහන් කොට නොමැත. මේ වන විට සියලු වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර ඇති අතර, මින් ඉදිරියට සිදු කරනු ලබන වත්කම් අපහරණය මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙන් ගැලපීම් කිරීමට කටයුතු කරනු ලබන බව සඳහන් කරමි. |
| (ආ). 2018 ජුලි 16 දිනැති අංක 03/2018 දරන ජාතික අයවැය චක්‍රලේඛය සහ 2019 අගෝස්තු 19 දිනැති අංක SA/AS/AA/Circular දරන ලිපිය ප්‍රකාරව කල්බදු වත්කම් මිලදී ගැනීම් ගිණුම් ගත කළ යුතු වේ. එහෙත් සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.59,044,000 ක්වූ කල්බදු වාහන 07 ක් මිලදී ගැනීම්, මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණු නමුත්, කාර්යාලයේ නව සිගාස් වැඩසටහන (New CIGAS) අනුව වත්කම් | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කල්බදු වත්කම් ගිණුම්ගත කළ යුතු වීම. | දක්වා ඇති පරිදි නියමිත සංකේතාංකය නිවැරදි කර ගැනීමට මේවන විටත් කටයුතු කර ඇත. |

වාර්තාවෙහි, කල්බදු වත්කම් මිලදී ගැනීම් ලෙස වාර්තා වී තිබුණේ කල්බදු වාහන 02 ක එකතුව රු.16,910,000 ක වටිනාකම පමණි. ඒ අනුව, ඉතිරි කල්බදු වාහන 05 හි එකතුව වූ රු.42,134,000 වටිනාකම, සෘජු මිලදී ගැනීම් වශයෙන් ගිණුම් ගත කර තිබුණි.

## 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ). රාජකාරී දුරකථන ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 845(1) ප්‍රකාරව රාජකාරී දුරකථන ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව රාජකාරී දුරකථන ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතු වීම. | දුරකථන බිල්පත් ගෙවීමේදී අදාල ගෙවීම් විස්තර ලේඛන ගත කර ගෙවීම් කරනු ලබන අතර, එහි යම් දෝෂයක් වේනම් තවදුරටත් යාවත්කාලීන කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. |
| **(ආ). වාහන ලොග් පොත්** | | |
| මුදල් රෙගුලාසි 1645(අ) ප්‍රකාර වාහන ලොග් පොත් යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පොදු 267 අකෘතිය ප්‍රකාරව වාහන ලොග් පොත් සෑම වාහනයක් සම්බන්ධයෙන්ම යාවත්කාලීනව පවත්වා ගත යුතු වීම. | ඔබගේ දැනුම්දීම අනුව නැවත පරීක්ෂා කර යම් දෝෂයක් වේ නම් නිවැරදි කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කරන ලදී. |
| **(ඇ). වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරිමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වාගත යුතු වීම. | කාර්යාලය සතුව පවතින සියලුම වාහන සම්බන්ධ විස්තර වාර්තාවක්, පරිගණකය මගින් යාවත්කාලීන කර පවත්වා ගෙන යන අතර, එම විස්තර ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී. කෙසේ වුවද අදාල විස්තර ලේඛනයක් ලෙස පවත්වා ගෙන යාමට නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලදී. |

### 1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i). මුදල් රෙගුලාසි 109 | 2017 සැප්තැම්බර් මාසයේදී රථයකට අනතුරක් සිදුවීම හේතුවෙන් වූ රු.358,721 ක අලාභයෙන් රු.10,809 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නැතිවීම්/හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මෙම අනතුර සම්බන්ධයෙන් වරදකරුවූ රියදුරුගෙන් මෙම මුදල අයකර මෙම කාර්යාලය වෙත ගෙවන ලෙස අදාල අමාත්‍යාංශය වෙත දන්වා ඇත. මේ පිළිබඳව අදාල අමාත්‍යාංශයෙන් නැවත විමසීමක් සිදු කරන ලෙසට නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. |
| (ii). මුදල් රෙගුලාසි 104 | 2017, 2018 සහ 2019 වර්ෂවල සිදුවූ වාහන අනතුරු සංඛ්‍යාව කොපමණද යන්න අනාවරණය නොවූ අතර, වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා අවසන් බවට සාක්ෂි නොතිබුණි. ඒ වෙනුවෙන් පිළියෙල කළ යුතු අවසන් වාර්තාවල පිටපත්, 2020 ජුනි 03 දින දක්වාම විගණනය වෙත ඉදිරිපත් | නැතිවීම්/හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර, නියමිත කාලවකවානු තුළ අදාල වාර්තාවල පිටපත්, විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වීම. | 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා එම වර්ෂය තුළ සිදුවූ වාහන අනතුරුවලට අදාල මූලික විමර්ශනයන් සිදු කරන ලද අතර, විමර්ශනයේදී අනාවරණය වූ කරුණු හා මූලික විමර්ශන නිලධාරී නිර්දේශයන් පදනම් කරගනිමින් ගොනුව අවසන් කිරීමට කටයුතු කර ඇත. එම ලිපිගොනු විගණනය සඳහා |

| | | | |
|---|---|---|---|
| | කර නොතිබුණි. | | ලබාදීමට කටයුතු කරනු ඇත. |
| (iii). මුදල් රෙගුලාසි 138(5), 231(1) | ඉන්වොයිස්වල මුල් පිටපත වෙනුවට ෆැක්ස් සහ ඊමේල් මගින් ලබා ගත් ඉන්වොයිසි සහ ඉන්වොයිසිවල ඡායා පිටපත් සහිතව වවුචර් සහතික කර, එකතුව රු.2,502,559 ක් වූ වවුචර් 31 ක් සඳහා ගෙවීම් සිදු කර තිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන පිළිබඳව අවධානය යොමු කළ යුතු වීම. | මෙලෙස කටයුතු කිරීමට සිදුවන්නේ අදාල භාණ්ඩය හෝ සේවාව සපයනු ලබන ආයතනය වෙතින් අදාල භාණ්ඩය හෝ සේවාව ලබා ගැනීම සඳහා ප්‍රථමයෙන් මුදල් ගෙවීම සිදු කළ යුතු වන අවස්ථාවන්වලදීය. මුල් පිටපතේ හා ෆැක්ස්/ඡායා පිටපතේ වෙනස්කම් දක්නට නොලැබෙන බැවින් කිසිදු අක්‍රමිකතාවයක් සිදුවී නොමැත. |
| (iv). මුදල් රෙගුලාසි 208(3), 211(3), 145(3), 146 සහ 449 | ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ලබාදී තිබුණු රු.600,000 ක අත්තිකාරම් සඳහා බිල්පත් ලබාගැනීමකින් තොරව, පියවීමට කටයුතු කර තිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මෙම අලුත්වැඩියාවන් සිදු කර ගැනීමේදී ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත මුදල් ප්‍රතිපාදන පවරා අදාල කාර්යය කර ගැනීමට නොහැකි වූ බැවින් ඔවුන් වෙත අග්‍රිම අත්තිකාරම් ලබා දි එම කාර්යයන් ඉටු කර ගැනීමට කටයුතු කොට ඇත. |

**(ආ). රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

-----------------------------

| | | | |
|---|---|---|---|
| (i). 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009, 2009 ජුනි 17 දිනැති අංක 09/2009(I) සහ 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 | අමාත්‍ය කාර්ය මණ්ඩල, අමාත්‍යාංශ ලේකම්වරුන්, ආයතන ප්‍රධානීන් ඇතුළුව සියළුම රාජ්‍ය සේවකයන් තම සේවා ස්ථානයට | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ගෙවීම් සිදු කොට ඇත්තේ නියමිත පරිදි පැමිණීම් හා පිටවීම් සනාථ කර ගැනීමෙන් අනතුරුව බව සඳහන් කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| | දරන චක්‍රලේඛ | පැමිණීම සහ පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මගින් සනාථ කළ යුතු වුවත්, කාර්යාලයේ සියළුම නිලධාරීන් එසේ සිදු කර නොතිබුණි. | | |
| (ii). | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයේ IV ඡේදය | නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කර ගන්නේ නම් එම කාලය ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මගින් සනාථ කල යුතුය. එසේ වුවත් ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පැමිණීම-පිටවීම සටහන් කිරීමකින් තොරව, සමාලෝචිත වර්ෂය තුළ ප.ව.6.30 න් පසුව පාර්ලිමේන්තු රැස්වීම් අවසන් වූ දිනක් වෙනුවෙන් එක් නිලධාරියෙකුට රු.750 බැගින් එකතුව රු.2,051,575 ක ප්‍රවාහන (රැස්වීම්) දීමනා, රු.2,207,109 ක අතිකාල හා නිවාඩුදින වැටුප් සහ 2019 වර්ෂයේ ඉතිරි කරගත් නිවාඩු සඳහා ගෙවීම් රු.1,157,291 ක්ද වශයෙන් මුළු එකතුව රු.5,415,975 ක ගෙවීම් සිදු කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ගෙවීම් කළ යුතු වීම. | ගෙවීම් සිදු කොට ඇත්තේ නියමිත පරිදි පැමිණීම් හා පිටවීම් සනාථ කර ගැනීමෙන් අනතුරුව බව සඳහන් කරමි. |

**(ඇ). රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

| | | | | |
|---|---|---|---|---|
| (i). | 2016 පෙබරවාරි 16 දිනැති අංක 431(1) දරන චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, යානපත්‍ර මිලදී ගැනීමේදී, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානලින් බැහැරව, යානපත්‍ර මිලදී ගැනීම සඳහා රු.308,546 ක මුදලක් වැය කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ජාතික ගුවන් සේවයෙන් ගුවන් යානාපත් මිලදී ගෙන ඇත. |
| (ii). | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන චක්‍රලේඛයේ 03 ඡේදය | විපක්ෂ නායක නිල නිවාස දෙකක් වන B-12 දරන රජයේ බංගලා නිවාසය සහ විජේරාම නිල නිවාසයට අදාල 2019 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වීම. | B-12 නිල නිවාසය පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය වෙත පවරා දී ඇති බැවින්, මෙම නිල නිවාසයේ භාණ්ඩ සඳහා 2020.06.02 දින රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත නිකුත් කිරීමේ නියෝග යවා ඇත. |

**(ඈ). ජාතික අයවැය චක්‍රලේඛ**

| | | | | |
|---|---|---|---|---|
| (i). | 2014 ජනවාරි 01 දිනැති අංක 1/2014 දරන චක්‍රලේඛයේ 2.1.4 ඡේදය | රාජ්‍ය සේවකයින්ගේ පුහුණු හා හැකියා වර්ධනයට අදාල වියදම් ප්‍රාග්ධන ප්‍රතිපාදන තුළින් දැරීම සිදු කළ යුුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ පුහුණු හා හැකියා වර්ධනයට අදාලව දරා ඇති එකතුව රු.447,823 ක් පුනරාවර්තන ප්‍රතිපාදන යටතේ ගිණුම් ගත කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මේ සඳහා විෂයය 2401 යටතේ භාණ්ඩාගාරයෙන් අතිරේක ප්‍රතිපාදන ඉල්ලුම් කළද, ඒ සඳහා ප්‍රතිපාදන ලැබී නොමැති අතර, 2019 වසරට අනුමත ප්‍රතිපාදන තුළ වියදම කළමනාකරණය කර ගැනීමට අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක BD/GPS/19/1/2/1-2019 හා 2019.10.08 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ii). | 2019 අප්‍රේල් 08 දිනැති අංක 03/2019 සහ 2019 ජුනි 17 දිනැති අංක 04/2019 දරන චක්‍රලේඛ | චක්‍රලේඛ විධිවිධානවලින් බැහැරව, දේශීය අරමුදල් භාවිතා කරමින් නිලධාරීන් නිලධාරීන් 07 දෙනෙකු වෙනුවෙන් විදේශ සංචාර/අධ්‍යයන චාරිකාවක් සඳහා රු.932,485 ක්ද, විදේශ ගමන් වියදම් හැකිතාක් අවම කිරීමට උපදෙස් ලබාදී තිබියදී, ඊට පටහැනිව නිලධාරීන් තිදෙනෙකුගේ විදේශ සංචාර/අධ්‍යයන චාරිකා 02ක් වෙනුවෙන් රු.447,823 ක්ද වශයෙන්, සමාලෝචිත වර්ෂයේ මැයි සිට ඔක්තෝබර් දක්වා කාලය තුළ එකතුව රු.1,380,308 ක වියදම් දරා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මෙම කාර්යාලයේ නිලධාරීන් හත්දෙනෙකු හට මැලේසියානු පාර්ලිමේන්තු ක්‍රමය පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා දින 03ක විදෙස් අධ්‍යයන අවස්ථාවක් ලබාදී ඇත. එසේම නිලධාරීන් තිදෙනෙකු සඳහා චීනයේ අධ්‍යයන වැඩසටහනක් සඳහා අවස්ථාව ලැබී ඇති අතර, ඔවුන් හට මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ 01/2015/01 අනුව අදාළ ගෙවීම් සිදු කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම

----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු බැඳීම් හා බැරකම්, භාණ්ඩාගාරය විසින් නිකුත් කර තිබුණු බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය සමග සැසඳී තිබිය යුතුවේ. එසේම වාර්තා නොකළ කිසිදු බැඳීමක් හෝ බැරකමක්, පෙර වර්ෂයේ වියදමක් ලෙස නිරවුල් නොකළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසාන දිනට භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද බැඳීම් හා බැරකම් ප්‍රකාශයෙහි වාර්තා වී නොතිබුණු, එකතුව රු.213,710 ක් වූ සමාලෝචිත වර්ෂයට අදාල බැඳීම් සහ බැරකම් ලෙස 2020 වර්ෂයේදී නිරවුල් කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශනවල සටහන-(iii) යටතේ දක්වා තිබුණු බැඳීම් හා බැරකම්, භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද බැඳීම් හා බැරකම් ප්‍රකාශය සමග එකඟ විය යුතු අතර, එලෙස වාර්තා නොකළ කිසිදු බැඳීමක් හෝ බැරකමක්, පෙර වර්ෂයේ වියදමක් ලෙස 2020 වර්ෂයේදී නිරවුල් නොකළ යුතු වේ. | මූල්‍ය ප්‍රකාශනයේ සටහන **(iv)** යටතේ දැක්වූ බැරකම් ඉදිරි වර්ෂයේ ප්‍රතිපාදන තුළින් ගෙවීම් කිරීමේ අපේක්ෂාවෙන් ඇතිකරගත් බැඳීම් වනු ඇත. **CIGAS** පරිගණක මෘදුකාංගය තුළින් බැරකම් ඇතුළත් කළ හැකි වනුයේ අපවත්නා ප්‍රතිපාදන සීමාවන් තුළය. ඒ අනුව 2019 වර්ෂය තුළදී එම බැරකම්, බැරකම් ලෙස **CIGAS** මෘදුකාංගයට ඇතුළත් කළ නොහැකි වනු ඇත. ඒ හේතුවෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද බැරකම් ප්‍රකාශයේ මෙම වටිනාකම් ඇතුළත් වී නොමැති බව සඳහන් කරමි. |